# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
# பொலிஸ் ஊடகப் பிரிவு
# POLICE MEDIA DIVISION
සුහුරුපාය, බත්තරමුල්ල

තැ.පෙ.අංකය
த. பெ.இ 10120
2171635
Po.Box No

ෆැක්ස්
தொலைநகல 011-
Fax

දුරකථන
தொலைபேசி 011-2887973 (HUNTING)
Telephone

වෙබ්.ලිපිනය
இணையதளம் www.Police.lk
Web Site

ඊ මේල්
மின்னஞ்சல் dir.media@police.gov.lk
E-mail


මගේ අංකය
எனது இலக்கம் 1583/2024
My NO

ඔබේ අංකය
உமது இலக்கம் / 2024
Your No

දිනය
திக 15/10/2024
Date පැය 1000

## මාධ්‍ය නිවේදනය

**01. නිවෙස් බිඳ දේපල සොරකම් කළ සැකකරුවන් දෙදෙනෙකු හෙරොයින් සමඟ අත්අඩංගුවට - ගම්පහ කොට්ඨාස අපරාධ විමර්ශන කාර්යංශය.**

2024.10.14 වන දින උදෑසන කාලයේදී මල්වතුහිරිපිටිය පොලිස් වසමේ වරපලාන ප්‍රදේශයේදී ගම්පහ කොට්ඨාස අපරාධ විමර්ශන කාර්යංශයේ නිලධාරීන් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර **හෙරොයින් ග්‍රෑම් 05 මිලිග්‍රෑම් 361 ක් සන්තකයේ තබා ගෙන සිටි සැකකරුවෙකු** අත්අඩංගුවට ගෙන ඇත.

සැකකරුගෙන් කරන ලද ප්‍රශ්න කිරීමේදී මල්වතුහිරිපිටිය, යක්කල, දොම්පේ, වීරගුල හා බඩල්ගම පොලිස් වසම්වල නිවෙස් බිඳ දේපල සොරකම් කිරීමේ සිද්ධීන් කිහිපයකට අවශ්‍ය කරන සැකකරු බවටත් සොරකම් කරන ලද දේපල තවත් සැකකරුවෙකුට ලබා දී ඇති බවටත් අනාවරණය වී ඇත. පසුව සොරබඩු ළඟ තබා ගෙන සිටි සැකකරුවෙකු මීගමුව පොලිස් වසමේදී අත්අඩංගුවට ගෙන ඇත. රන් මාලයක්, රන් කරාබු 05 ක්, පෙන්ඩන් 03 ක්, ජංගම දුරකථන 02 ක්, අත් ඔරලෝසු 03 ක්, ගෑස් සලින්ඩර් 05 ක්, වාහන බැටරි 02 ක්, වෙන් ෂෝ මැෂින් 01 ක්, තණකොළ කපන මැෂින් 02 ක්, ප්‍රෙෂර් ගන් 02 ක්, සීලර් යන්ත්‍ර 02 ක්, වතුර මෝටරයක් සහ බඟල් 02 ක් පොලිස් භාරයට ගෙන සැකකරුවන් සමඟ මල්වතුහිරිපිටිය පොලිස් ස්ථානය වෙත ඉදිරිපත් කර ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරුවන් අවුරුදු 34 හා 47 වයස්වල පසුවන දෙවලපොල හා මීගමුව ප්‍රදේශවල පදිංචිකරුවන් වේ.**

මල්වතුහිරිපිටිය පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

## 02. හෙරොයින් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - වාද්දුව පොලිස් ස්ථානය.

2024.10.14 වන දින රාත්‍රී කාලයේදී වාද්දුව පොලිස් වසමේ පනාපිටිය හන්දිය අසලදී වාද්දුව පොලිස් ස්ථානයේ නිලධාරීන් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර **හෙරොයින් ග්‍රෑම් 10 මිලිග්‍රෑම් 200 ක් සන්තකයේ** තබාගෙන සිටි සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 40 ක් වන වාද්දුව ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

වාද්දුව පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

## 03. හෙරොයින් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - බ්ලූමැන්ඩල් පොලිස් ස්ථානය.

2024.10.14 වන දින සවස් කාලයේදී බ්ලූමැන්ඩල් පොලිස් වසමේ ඉබ්බාවත්ත හන්දියේදී බ්ලූමැන්ඩල් පොලිස් ස්ථානයේ නිලධාරීන් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර **හෙරොයින් ග්‍රෑම් 11 මිලිග්‍රෑම් 470 ක් සන්තකයේ** තබාගෙන සිටි සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 27 ක් වන මෝදර ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

බ්ලූමැන්ඩල් පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

## 04. කඳන් තුවක්කුවක් පත්තු වී පුද්ගලයෙකු මිය යාමක් - මහකුඹුක්කඩවල පොලිස් ස්ථානය.

2024.10.14 වන දින උදෑසන කාලයේදී මහකුඹුක්කඩවල පොලිස් වසමේ වල්පාලුව කොහොඹ යාය රක්ෂිතයේ සතුන් දඩයමේ ගිය පුද්ගලයින් දෙදෙනෙකුගෙන් එක් පුද්ගලයෙකුට බඳින කඳන් තුවක්කුවක් පත්තු වී බරපතල තුවාල ලබා රක්ෂිතයෙන් පිටතට රැගෙන එමින් සිටියදී මිය ගොස් ඇති බවට මහකුඹුක්කඩවල පොලිසියට ලද තොරතුරක් මත විමර්ශන ආරම්භ කර ඇත.

**මරණකරු වයස අවුරුදු 32 ක් වන කොරකහයාය, සියඹලාගස්හේන ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මහකුඹුක්කඩවල පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**